## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙහි කළමණාකරන සහකාර තාක්ෂණික නොවන- ඛණ්ඩ 2

## සේවා ගණය සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව :ජාතික කෞතුකාගාර යොමු අංකය : ජා.කෞ.ආ/ඊ1/95(vi) දිනය : 2011.11.25
MN1-2006

1.2 අමාත්‍යාංශය : ජාතික උරුමයන් පිළිබඳ යොමු අංකය : NH/1/9/1/27 දිනය : 2012.01.10

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින්
තනතුරු අනුමත කිරීම : යොමු අංකය : DMS/C04/29-03 දිනය : 2011.06.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ
නිර්දේශය යොමු අංකය : EST-3/RECRU/04/6302 දිනය : 2012.02.28

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන්
සභාවේ නිර්දේශය යොමු අංකය : NSCC/2/3/3/3/52 දිනය : 2009.10.05

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
අනුමැතිය යොමු අංකය : PSC/EST/2/1/29/3/1/2013 දිනය : 2013.06.27

**02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර**

2.1. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1. සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන-ඛණ්ඩ 2

3.2. ශ්‍රේණි : III, II හා I

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයේ විධායක හා පරිපාලන මට්ටම්වල නියුතුවූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නාවූද, ඒකල ස්වරූපයේවූද (Single Function) කාර්යයන් මෙම සේවා ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂීකොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4. කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැව රෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙහි කළමණාකරන සහකාර තාක්ෂණික නොවන- ඛණ්ඩ 2

## සේවා ගණය සඳහා වන බඳවාගැනීමේ පටිපාටිය

### 01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව :ජාතික කෞතුකාගාර යොමු අංකය : ජා.කෞ.ආ/පි1/95(vi) දිනය : 2011.11.25
MN1-2006

1.2 අමාත්‍යාංශය : ජාතික උරුමයන් පිළිබඳ යොමු අංකය : NH/1/9/1/27 දිනය : 2012.01.10

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින්
තනතුරු අනුමත කිරීම : යොමු අංකය : DMS/C04/29-03 දිනය : 2011.06.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ
නිර්දේශය යොමු අංකය : EST-3/RECRU/04/6302 දිනය : 2012.02.28

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන්
සභාවේ නිර්දේශය යොමු අංකය : NSCC/2/3/3/3/52 දිනය : 2009.10.05

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
අනුමැතිය යොමු අංකය : PSC/EST/2/1/29/3/1/2013 දිනය : 2013.06.27

### 02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ

### 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන-ඛණ්ඩ 2

3.2. ශ්‍රේණි : III, II හා I

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයේ විධායක හා පරිපාලන මට්ටම්වල නියුතුවූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නාවූද, ඒකල ස්වරූපයේවූද (Single Function) කාර්යයන් මෙම සේවා ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂීකොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4. කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැව රෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යෝෂ්‍යතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

| | | | |
|---|---|---|---|
| ආරක්ෂක සහකාර | - | 03 | කෞතුකාගාර මුරකරුවන්ගේ රාජකාරී කටයුතු වල ක්‍රමවත්භාවය හා ඵලදායීතාවය පිළිබඳව කෞතුකාගාර ප්‍රධානීන්ට වගකීම, මුරකරුවන්ගේ රාජකාරී රෝස්ටර සැකසීම, මුරකරුවන්ට ලබාදියයුතු පුහුණුවීම් ලබාදීමට ප්‍රධාන ආරක්ෂක නිලධාරීට සහායවීම, ප්‍රධාන ආරක්ෂක නිලධාරී සමඟ දෙපාර්තමේන්තුවේ හා කෞතුකාගාර වල ආරක්ෂක සැලසුම් සකස් කිරීම. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 07 (හතකි)

| | |
|---|---|
| චර්ම ශිල්පී | 01 |
| ආදර්ශ රූප කලාකරු | 03 |
| ආරක්ෂක සහකාර | 03 |
| **එකතුව** | **07** |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III,II,I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

7.1. බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත(බාහිර අයදුම්කරුවන්ගෙන්) | සීමිත පදනමින් බඳවා ගැනීම් කළ නොහැකි අවස්ථාවන්හීදී පමණක් අදාල කරගනු ලැබේ. |
| සීමිත | 100% |
| කුසලතා | අදාල නොවේ |

7.2. **විවෘත බඳවා ගැනීම්** :- සීමිත බඳවා ගැනීම් මගින් බඳවා ගැනීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පමණක් විවෘත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය :III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම් :

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ) **චර්ම ශිල්පී** - අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂයය ධාරාවෙන් අවම වශයෙන් විෂයයන් 02 (දෙකක්) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. පැරණි විෂයය නිර්දේශය අනුව විෂයයන් 03 කින් (තුනකින්) සමත්වීම.

(ඇ) **ආදර්ශ රූප කලාකරු, ආරක්ෂක සහකාර** - අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය ධාරාවකින් අවම වශයෙන් විෂයයන් 02 (දෙකක්) (සාමාන්‍ය පො පරීක්ෂණය හැර) සමත්ව තිබීම. පැරණි විෂයය නිර්දේශය අනුව විෂයයන් 03 කින් (තුනකින්) සමත්වීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් :

| තනතුර | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| චර්ම ශිල්පී | තරුණ සත්ත්ව වේදීන්ගේ සංගමය,පාරිසරිකයෝ වැනි සංගමයක සත්ත්ව විද්‍යාවට අදාල වැඩමුළුවකට සහභාගී වී සහතික පත්‍රයක් ලබා තිබීම. |
| ආදර්ශ රූප කලාකරු | චිත්‍ර,මූර්ති,මෝස්තර හෝ කැටයම් කලාව පිළිබඳ මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා සාර්ථකව නිම කර තිබීම. |
| ආරක්ෂක සහකාර | අදාල නොවේ. |

7.2.2.3 පළපුරුද්ද - අදාල ක්ෂේත්‍රයේ වසර 01 ක පළපුරුද්ද

7.2.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. ආරක්ෂක සහකාර තනතුර සඳහා උස අඩි 05 අඟල් 04 ට වැඩිවිය යුතු අතර පපුවේ පළල අඟල් 32 ක් හෝ ඊට වැඩි විය යුතුය.

7.2.2.5. වෙනත් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3. වයස :

7.2.3.1. අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2. උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය :- ලිඛිත විභාගයක් මගින් බඳවා ගනු ලැබේ.

7.2.4.1. ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝග්‍යතාවය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

(විස්තර ඇමුණුම 01 මගින් දැක් වේ.)

7.2.4.1.1 පවත්වන බලධරයා : ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :-ලිඛිත විභාගයෙන් සමත් වූ නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා ඇතිද යන්න පරීක්ෂාව.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා :- ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාල නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය:-රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 **සීමිත බඳවාගැනීම්**

7.3.1 බඳවාගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ප්‍රාථමික ශිල්පීය නොවන, ප්‍රාථමික අර්ධ ශිල්පීය හා ශිල්පීය සේවා ගණයන්හි පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධරයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් : භාෂාව සහ ගණිතය ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයකින් සමත් වී තිබීම.

සටහන :- චර්ම ශිල්පී තනතුර සඳහා අ.පො.ස (උ/පෙළ)ජීව විද්‍යා විෂයයන් හදාරා ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනේ.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් :

| තනතුර | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| චර්ම ශිල්පී | තරුණ සත්ත්ව වේදීන්ගේ සංගමය,පාරිසරිකයෝ වැනි සංගමයක සත්ත්ව විද්‍යාවට අදාල වැඩමුළුවකට සහභාගී වී සහතික පත්‍රයක් ලබා තිබීම. |
| ආදර්ශ රූප කලාකරු | චිත්‍ර,මූර්ති,මෝස්තර හෝ කැටයම් කලාව පිළිබඳව මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා සාර්ථකව නිම කර තිබීම. |
| ආරක්ෂක සහකාර | අදාල නොවේ. |

7.3.2.3. පළපුරුද්ද : මෙම දෙපාර්තමේන්තුවේ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සේවා ගණයන්ට අදාළ ස්ථිර තනතුරක, නියමිත දිනට පූර්වාසන්නව යටත් පිරිසෙන් වසර පහ (05) ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, එම අදාල තනතුරේ ස්ථිර කරනු ලැබ තිබිය යුතුය. ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

7.3.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5. වෙනත් :

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

සටහන :- යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් හා යථ තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත 7.3.2.3 හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

7.3.3. වයස : අදාල නොවේ.

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් මගින් බඳවා ගනු ලැබේ.

7.3.4.1. ලිඛිත විභාගය :-

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝග්‍යතාව | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

(විස්තර ඇමුණුම් 01 මගින් දැක් වේ.)

7.3.4.1.1 පවත්වන බලධරයා : ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් අනුමත කරන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ.

7.3.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නොවේ.

7.3.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු ලැබේ.) : අදාළ නොවේ.

7.3.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පත්කරනු ලබන බලධරයා :ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ජාතික කෞතුකාගාරයේ හා එයට අනුබද්ධ ප්‍රාදේශීය කෞතුකාගාරයන්හි දැන්වීම් ප්‍රදර්ශණය කිරීම මගින්

7.4 කුසලතා මත බඳවාගැනීම : අදාළ නොවේ.

**08. කාර්යක්ෂමතා කඩඉම්**

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත / වෘත්තීය / සහතික පාඨමාලා /වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. |

8.2. කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද - වසරකට දෙවරක්

8.3. කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

1· වන කාර්යක්ෂමතා කඩඉම - ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

2 වන කාර්යක්ෂමතා කඩඉම - ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

3 වන කාර්යක්ෂමතා කඩඉම - ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

**09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව**

9.1.

| ශ්‍රේණිය | ලබා ගත යුතු ප්‍රවීනතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුලදී ලබා ගත යුතුය. |
| 02.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

**10. ශ්‍රේණි උසස් කිරීම**

10.1. III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන් :-

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.

Ii සේවා ගණයේ iii ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

iii අනුමත කාර්යසාධන අගැයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2. IIවන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

ii.උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii.අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරණු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි Iශ්‍රේණියට උසස් කිරිම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**සංලක්ෂය :-**

1. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**11.** තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :**

මෙම බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් විධිවිධානවලට අමතරව ආයතන සංග්‍රහයේ සහ අංක. 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට සෑම සේවකයෙකුම යටත් වේ.

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

**සක්‍රිය සේවා කාලය යනු :** ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14 සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම -

සේවයේ යෙදී සිටින නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය ඇමුණුම 6 මගින් දැක්වේ. ආරක්ෂක සහකාර තනතුර නව තනතුරක් බැවින් අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය අදාල නොවේ.

15. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් "රාජ්‍ය සේවා කොමිෂන් සභාව " විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ :-අත්සන: ..................................

නම : ආර්.ඒ.එස්.එස්.රණවීර

තනතුර : රාජ්‍ය කළමනාකරණ සහකාර

දිනය : 2014.04. 08

පරීක්ෂා කලේ :-අත්සන: ..................................

නම : ටී.ඩී.එන්. ප්‍රනාන්දු

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)

දිනය : 2014.04.09

අත්සන ................................................ (දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :

සනූජා කස්තුරිආරච්චි
අධ්‍යක්ෂ (වැ.බ)
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07.

තනතුර :

දිනය : 2014.04. 09

71

යොමු අංකය : NH/1/9/1/27

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමණාකරන සහකාර තාක්ෂණික නොවන- ඛණ්ඩ 2 සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම : බර්නාඩ් වසන්ත.

ලේකම් (වැ.බ.) බර්නාඩ් වසන්ත
අතිරේක ලේකම්
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය
සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල.

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

දිනය : 2014.04 නිල මුද්‍රාව : ..........................................

යොමු අංකය : PSC/EST/2/1/23/1/2013

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමණාකරන සහකාර තාක්ෂණික නොවන- ඛණ්ඩ 2 සේවා ගණය සඳහා සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2013.06.27 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................................

නම : ..........................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014 05 29 නිල මුද්‍රාව : ..........................................

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම 01

01. විභාගයේ නම : ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.අභියෝග්‍යතාව | පැය 1 යි | 100 | 40% |
| 2.සාමාන්‍ය දැනීම | පැය 1 යි | 100 | 40% |

03. පවත්වන බලධරයා : ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව : අවශ්‍යතාව පරිදි.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.අභියෝග්‍යතාව | අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය කුසලතාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.බහුවරණ හෝ කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්ණ 30 කින් සමන්විතය. |
| 2.සාමාන්‍ය දැනීම | රාජකාරී සඳහා අපේක්ෂකයා සතු කුසලතාවයන් හා යෝග්‍ය තාවයන් පරීක්ෂා කෙරෙන සමාජ ආර්ථික පසුබිම,දේශීය තොරතුරු,අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වැඩ සටහන් හා ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රශ්ණ ඇතුලත් බහුවරණ ප්‍රශ්ණ පත්‍රයකි. |

සකස් කළේ :-අත්සන : ........................................

නම : ආර්.ජේ.එස්.එස්.රණවීර

තනතුර : රාජ්‍ය කළමනාකරණ සහකාර

දිනය : 2014.04.08

පරීක්ෂා කළේ :-අත්සන : ........................................

නම : ටී.ඩී.එන්. ප්‍රනාන්දු

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)

දිනය : 2014.04. 09

අත්සන :........................................ (දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : සනූජා කස්තුර්ආරච්චි

තනතුර අධ්‍යක්ෂ (වැ.බ) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කොළඹ 07. දිනය : 2014.04. 09

01.විභාගයේ නම :- **ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණය සඳහා පැවැත්වෙන 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

02.විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.ආයතන හා කාර්ය පටිපාටි සංග්‍රහය | පැය 1 යි | 100 | 40% |
| 2.මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | පැය 1 යි | 100 | 40% |

03.පවත්වන බලධරයා : ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04.විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක්

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන හා කාර්ය පටිපාටි සංග්‍රහය | ආයතන සංග්‍රහයේ Iකාණ්ඩයේ II. IV. V. VII. VIII .XII. XIV. XVII .XXIV. XXVIII .XXXIපරිච්ඡේද |
| 2.මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | මුදල් රෙගුලාසි IV. V .VI. IX පරිච්ඡේද |

සකස් කළේ :-අත්සන : ..................................... පරීක්ෂා කළේ :-අත්සන : .....................................

නම : ආර්.ඒ.එස්.එස්.රණවීර නම : ටී.ඩී.එන්. ප්‍රනාන්දු

තනතුර : රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)

දිනය : 2014.04. ०७ දිනය : 2014.04.०१

අත්සන :..................................... (දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :

**සනූජා කස්තුරිආරච්චි**
**අධ්‍යක්ෂ (වැ.බ)**
තනතුර : **ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**
**කොළඹ 07.**

දිනය : 2014.04. ०१

01.විභාගයේ නම :- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණය සඳහා පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02.විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.තනතුරට අදාල විෂය දැනුම | පැය 1 යි | 100 | 40% |
| 2.පොදු ප්‍රශ්ණ පත්‍රය | පැය 1 යි | 100 | 40% |

03. පවත්වන බලධරයා : ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රය | විෂය නිර්දේශය | |
|---|---|---|
| 1. තනතුරට අදාල විෂය දැනුම | චර්ම ශිල්පී | සත්ව ආදර්ශ නියැදි ලබා ගැනීම , ලේඛන ගත කිරීම , ගබඩා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |
| | ආදර්ශ රූප කලාකරු | සාම්ප්‍රදායික චිත්‍ර මෝස්තර හා කැටයම් පිළිබඳ දැනුම සහ නවීන පරිගණක මෘදුකාංගවලින් කරනු ලබන කලා නිර්මාණ පිළිබඳ අවබෝධය |
| | ආරක්ෂක සහකාර | දේශීය හා විදේශීය කෞතුකාගාරවල ආරක්ෂාව සඳහා යොදා ඇති උපක්‍රම හා කෞතුකාගාර ආරක්ෂාව පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් සහිත ප්‍රශ්න පත්‍රයකි. |
| 2. පොදු ප්‍රශ්ණ පත්‍රය | කොටස් දෙකකින් සමන් විතය.<br>1. කිසියම් ප්‍රකාශයක් හෝ සාකච්ඡාවක සටහනක් කියවා අවබෝධ කොට ගෙන ලිපියක් හෝ වාර්තාවක් පිළියෙල කිරීම<br>2. කාලීන සමාජීය සිදුවීම් පිළිබඳ අවබෝධ කොට ගෙන විග්‍රහ කර දැක්වීම පිළිබඳ හැකියාව මැනීම. | |

සකස් කළේ :-

අත්සන : ..........................................................

නම : ආර්.ජේ.එස්.එස්.රණවීර

තනතුර : රාජ්‍ය කළමනාකරණ සහකාර

දිනය : 2014.04.08

පරීක්ෂා කළේ :-

අත්සන : ..........................................................

නම : ටී.ඩී.එන්. ප්‍රනාන්දු

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)

දිනය : 2014.04.09

අත්සන ........................................................ (දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම ........................................................

තනතුර සඳුජා කස්තුරිආරච්චි අධ්‍යක්ෂ (වැ.බ) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කොළඹ 07. ............................ දිනය : 2014.04.09

01.විභාගයේ නම :- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණය සඳහා පැවැත්වෙන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02.විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය | පැය 1 යි | 100 | 40% |
| 2. දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය හා විෂය පථය | පැය 1 යි | 100 | 40% |

03. පවත්වන බලධරයා : ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය | ස්වකීය තනතුරට අදාල ගැටළුවකට ගත යුතු ක්‍රියා මාර්ග විභාග වන පරිදි සැකසූ ප්‍රශ්ණ පත්‍රයකි |
| දෙපාර්තමේන්තුවේ කාර්ය හා විෂය පථය | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය,විෂය පථය හා ඒ කෙරෙහි බලපාන පනත් ,රෙගුලාසි,ජාත්‍යන්තර සම්මුතීන් හා එම ක්ෂේත්‍රයේ සුවිශේෂිතා පිළිබඳ දැනුම පරීක්ෂා කරන පරිදි සැකසූ ප්‍රශ්ණ පත්‍රයකි |

සකස් කළේ :-

අත්සන : ........................................

නම : ආර්.ඒ.එස්.එස්.රණවීර

තනතුර : රාජ්‍ය කළමනාකරණ සහකාර

දිනය : 2014.04.08

පරීක්ෂා කළේ :-

අත්සන : ........................................

නම : ටී.ඩී.එන්. ප්‍රනාන්දු

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)

දිනය : 2014.04.09

අත්සන ........................................ (දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම ........................................

සනූජා කස්තුරිආරච්චි
අධ්‍යක්ෂ (වැ.බ)
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07.

තනතුර ........................................ දිනය : 2014.04.09

**<u>සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම.</u>**

<u>(බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ.)</u>

නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව MN 1-2006 A පරිමාණයෙහි වැටුප් හිමි තනතුරක සේවයේ නියුතු එම තනතුරෙහි ස්ථිර කරන ලද නිලධරයන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධි විධාන වලට යටත්ව පහත සදහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. කෙසේ වෙතත්, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල නිලධරයාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල නිලධරයා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරකට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළග වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

MN 1- II ශ්‍රේණිය

MN 1-2006 A වැටුප් පරිමාණයේ වැටුප් හිමි තනතුරක ස්ථිර කරන ලද, එම තනතුරේ වසර 10 කට වඩා වැඩි, වසර 20 කට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත වැටුප් වර්ධක 10 ක් උපයා ගෙන ඇති නිලධරයින්

MN 1- II ශ්‍රේණියට ද,

MN 1- I ශ්‍රේණිය

MN 1-2006 A වැටුප් පරිමාණයේ වැටුප් හිමි තනතුරක ස්ථිර කරන ලද, එම තනතුරේ වසර 20 කට වඩා වැඩි, වසර 30 ට අඩු සක්‍රීය සේවා කාලයක් ඇති, වැටුප් වර්ධක 20 ක් උපයා ගෙන ඇති නිලධාරීන්,

MN 1- I ශ්‍රේණියටද,

අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

| | |
|---|---|
| සකස් කළේ :- | පරීක්ෂා කළේ :- |
| අත්සන : ........................................ | අත්සන : ........................................ |
| නම : ආර්.ඒ.එස්.එස්.රණවීර | නම : ටී.ඩී.එන්. ප්‍රනාන්දු |
| තනතුර : රාජ්‍ය කළමනාකරණ සහකාර | තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන) |
| දිනය : 2014.04.08 | දිනය : 2014.04.09 |

අත්සන : ........................................ (දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : සඳුජා කස්තුරිආරච්චි ................
අධ්‍යක්ෂ (වැ.බ)

තනතුර : ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07.

දිනය : 2014.04.09